# දක්ෂිණ ශ්‍රී ලංකාවේ ජනාවාස නාමකරණය කෙරෙහි බලපා ඇති සාධක පිළිබඳ විශ්ලේෂණයක්

එම්. එල්. එස්. දිසානායක, පී. ඩී. විජේසේකර සහ පින්නවල සංඝසුමන හිමි*
*pssumana@sjp.ac.lk/ Principal author

## හැඳින්වීම

කිසියම් ජන කණ්ඩායමක් තම මූලික අවශ්‍යතා සපුරා ගනිමින් භාෂාව, වාර්ගිකත්වය හෝ වෙනත් විසංගමන සාධකයක් මත නිශ්චිත පදනමකින් වාසය කරන ස්ථානය මානව ජනාවාසයක් ලෙස හැඳින්විය හැකිය. ජනාවාසයක් සතු සමාජීය හා සංස්කෘතික අර්ථය මෙන් ම අවකාශීය ව්‍යාප්තිය, රූපමිතික ලක්ෂණ සහ භූගෝලීය පිහිටීම ද එහි අනන්‍යතාව කෙරෙහි ප්‍රබල ලෙස බලපායි. පරිණාමවාදීන්ගේ අදහසට අනුව, ජනාවාස විකාශනයේ දී මුල් පදිංචිකරුවන් තම වාසස්ථාන සෙසු ප්‍රදේශයන්ගෙන් වෙන්කොට හඳුනා ගැනීම සඳහා හෙවත් තම ජනාවාසයේ අනන්‍යතාව තහවුරු කරගැනීම පිණිස අර්ථාන්විත නාමකරණයක් භාවිතාකර තිබේ (Pitkänen,1998). ජනාවාසයන්හි අනන්‍යතාව තහවුරු කරගැනීමෙහිලා බලපා ඇති අනුභාවික හෝ වාස්තවික සාධක තහවුරු කෙරෙන ප්‍රධානතම පිළිබිඹුව වන්නේ ඒවාට පටබැඳී ඇති සංඥා නාමයි. නෛරුක්තික, ඓතිහාසික සහ භූගෝල විද්‍යාත්මක තොරතුරු මත පදනම් ව ස්ථාන නාම වර්ගීකරණය පිළිබඳ ව අධ්‍යයනය කරන විෂය වශයෙන් ස්ථාන නාම විද්‍යාවට (toponymy) අනුව ජනාවාස සඳහා පටබැඳෙන අවිශේෂී සංඥා නාම (appellatives) කාලයක් තිස්සේ වර්ධනය වූ ජනගහනය අතර හුරුපුරුදු වීමත් සමග ක්‍රමයෙන් ඒවා සංඥා නාම (proper names) බවට පත් වෙයි. ස්ථාන නාම රටක ප්‍රවේණියෙන් මාත්‍රයක් සහ ඉතිහාසයෙන් කොටසක් වෙයි. ඒවා ජනගහනයක පූර්වාගමනය පිළිබඳ සංස්කෘතිකමය වගතුග ජීවන පිළිවෙල පිළිබඳ තොරතුරු දැක්වීමෙහිලා සමත් වෙයි (Maria, 2013). ශ්‍රී ලංකාවේ ජනාවාස නාමකරණය තුළ විවිධ යුගයන්හි දී නා නා ජාතීන්ගේ ආභාසය ලබා දිගු කලක් තිස්සේ පරිණාමය වූ භාෂාත්මක ලක්ෂණ හඳුනා ගත හැකි ය. මහාවංශයට අනුව විජය කුමරු සමග මෙරටට පැමිණි පිරිස් ගංගා ද්‍රෝණි ආශ්‍රිතව ජනාවාස පිහිටුවීමේ දී ස්ථානීය අනන්‍යතාවය තහවුරු කරන ලද්දේ ස්වකීය නම් පදනම් කරගත් නාමකරණයක් මඟිනි (අනුරාධ ග්‍රාම, උපතිස්ස ග්‍රාම). මෙයින් පැහැදිලි වන්නේ පුරාතන ශ්‍රී ලංකාවේ ස්ථාන නාමකරණය කෙරෙහි පුද්ගල නාම විශේෂීකරණය බලපා ඇති බවයි. ශ්‍රී ලංකාවේ ඓතිහාසික ජනාවාස විකාසනයේ දී වාරි ශිෂ්ටාචාරයේ දියුණුවත් පෙරදිග හා අපරදිග ආක්‍රමණිකයින්ගේ බලපෑමත් ජනාවාස නාමකරණය කෙරෙහි ඍජු ලෙසම බලපා ඇති බව පෙනේ (ධීරානන්ද හිමි 1967).

ජනාවාස නාමකරණය පිළිබඳ අධ්‍යයනයන් හි එක් මානයක් වන්නේ ඊට පසුබිම් වී ඇති හේතු සාධක විමර්ශනය කිරීමයි. ඓතිහාසික ජනාවාස විකාසනය තුළින් නිරූපිත නාමකරණය මගින් තත්කාලීන පදිංචිකරුවන්ගේ විස්තර මෙන්ම සංක්‍රමණිකයන් පිළිබඳ තෙරෙතුරු හෙළිදරවු කර ගැනීම තවත් මානයකි (Maria, 2013). විනී විතාරණ (1974) විසින් සිදු කරන ලද සම්භාව්‍ය සාහිත්‍ය තුළින් නිරූපිත ග්‍රාමනාම විග්‍රහයේ දී විවිධ වෘත්තීන් මත පදනම් වූ ජනාවාස නාමකරණයක් (මිණිගම්, රන්ගම්, රිදීගම්, කුඹල්ගම්, ගොපලුගම්, කෙවුල්ගම්, වෙදගම්, මුතුගම්) පිළිබඳව හෙළිදරවු කරයි. ග්‍රාමීය ජනාවාස ක්‍රමානුකූලව පරිපාලන

ඒකක බවට පත් වීමේ දී ඒවා පුර හෙවත් නගර යන නමින් ව්‍යවහාරයට පත් වූ බව අනුරාධ ග්‍රාම, තම්බපණ්ණි ග්‍රාම සහ උපතිස්ස ග්‍රාම යන ජනාවාස පසු කාලයේ අනුරාධපුර, තම්බපණ්ණි නගර සහ උපතිස්ස නගර බවට පත්වීමෙන් පෙනේ (එල්ලාවල 1962). භූ-වාග්විද්‍යාත්මක ප්‍රවේශයකින් ජනාවාස නාමකරණය පිළිබඳ සිදුකර ඇති අධ්‍යයනයන්ට අනුව උපභාෂාවන්හි බලපෑම පිළිබඳව මෙන් ම භාෂාකාලානුක්‍රමවේදය (glottochronology) පදනම් කරගත් විශ්ලේෂණයන් මගින් ද ඉතා වැදගත් පැතිකඩක් නිරාවරණය කරයි. අරිසෙන් අහුබුදු (1987) විසින් රචනා කරන ලද ලංකා ගම් නම් වහර ග්‍රන්ථයට ලියන ලද හැඳින්වීමක දී ඊලියන් ද සිල්වා ශ්‍රී ලංකාවේ ජනාවාස නාමකරණයේ දී ද්‍රවිඩ භාෂාවේ බලපෑම පිළිබඳ සනිදර්ශන විග්‍රහයක් ඉදිරිපත් කරයි. මෙයින් පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ ජනාවාස නාමකරණය පිළිබඳ පර්යේෂණ සඳහා පුළුල් අවස්ථාවක් පවතින බවයි.

## පර්යේෂණ ගැටළුව

ඈත අතීතයේ පටන් ශ්‍රී ලංකාවේ දක්ෂිණ දේශය හෙවත් දකුණු ලක විශේෂිත භූගෝලීය කලාපයක් වශයෙන් අනන්‍යතාවක් පිළිබිඹු කරයි. විවිධත්වයෙන් යුතු භූරූපණයක් සහිත වෙරළ තීරය, අඩතැනි කලාපය සහ උතුරු කඳුකර භූමිය සහිත ස්වාභාවික භූදර්ශනය ද, ආර්ථික සමාජ හා දේශපාලනික  පසුබිමද, ප්‍රාදේශීය භාෂා ව්‍යවහාරය හා සංස්කෘතිය ද එකී අනන්‍යතාව තහවුරු කරන සාධකයෝ ය. ශ්‍රී ලංකාවේ ඓතිහාසික ජනාවාස විකාසනයේ ආරම්භක යුගයේ පටන් විශේෂිත කලාපයක් වූ බැවින් එහි ජනාවාස නාමකරණයට ඇත්තේ ඉතා දිගු ඉතිහාසයකි. යටත් විජිත පාලන සමයන්හි දී ප්‍රබල බලපෑමකට ලක් වූ මෙම කලාපය අවකාශීය වශයෙන් පුළුල් සංස්කෘතික විවිධත්වයක් ද පෙන්වයි. එබැවින් කලාපයේ ජනාවාස නාමකරණය කෙරෙහි බලපා ඇති සාධක ඉතා සංකීර්ණ බව පෙනී යයි. භූ රූප, ජලවහනය, දේශගුණය ආදී භූගෝලීය සාධක මෙන් ම වෘත්තිය, කුලය, ආගම, ජන වර්ගය, සමාජ මට්ටම ආදී විවිධ සාධක දක්ෂිණ ශ්‍රී ලංකාවේ නාමකරණය කෙරෙහි බලපා ඇතැයි ගුණසේකර (1975) දක්වයි. මේවායින් කුමන සාධක වඩාත් ප්‍රබල ලෙස ජනාවාස නාමකරණය කෙරෙහි බලපා තිබේද? එයට හේතු මොනවා ද? ජනාවාස නාමකරණයේ පොදු සාධකවල අවකාශීය ව්‍යාප්තිය කෙබඳුද? යන කේන්ද්‍රීය ප්‍රශ්න අරමුණු කොට පර්යේෂණ ගැටළුව ගොඩනගා තිබේ.

## ක්‍රමවේදය


මෙම අධ්‍යයනය ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පදනම් කරගත් ගුණාත්මක ප්‍රවේශයන් සහිත එකකි. ඒ අනුව ප්‍රස්තුත අරමුණු සාධනය පිණිස ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ දිස්ත්‍රික්ක තුන (ගාල්ල, මාතර සහ හම්බන්තොට) එක් භූගෝලීය කලාපයක් වශයෙන් තෝරා ගන්නා ලදි. වඩාත් නිවැරදි තීරණ ලබාගැනීම සඳහා එම දිස්ත්‍රික්ක තුනටම අයත් සියලුම ග්‍රාම නිලධාරී වසම් විනිශ්චය සඳහා නියදීමේ ක්‍රමය යටතේ තෝරාගන්නා ලදි. ඒ අනුව ගාල්ල - ග්‍රාම නාම 902, මාතර - 656 සහ හම්බන්තොට - 585 නියැදිය වශයෙන් භාවිතයට ගැණිනි. දත්ත රැස් කිරීම අදියර දෙකකින් සිදු කරන ලද අතර පළමුවන පියවර යටතේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 1:50,000 භූලක්ෂණ සිතියම්වල අන්තර්ගත අදාල ග්‍රාමනාම සහිත අංකිත දත්ත සමුදායන් GIS මෘදුකාංගය භාවිතයෙන් තෝරාගන්නා ලද අතර දෙවනුව ශ්‍රී ලංකාවේ දකුණු පලාතට අයත් සියලුම ග්‍රාම නිලධාරී වසම්වල ඇති ග්‍රාම නාම විමර්ශනයට ලක් කරන ලදි.

**සොයාගැනීම්**

විශ්ලේෂණ ප්‍රතිඵල අනුව, දක්ෂිණ ශ්‍රී ලංකාවේ බොහෝ ජනාවාස අර්ථාන්විත භාෂා රූපයක් සමග ස්ථානයට අනන්‍ය වන පරිදි නම් කර ඇති බව පෙනේ. ගණනින් 2143 ක් වූ පර්යේෂණයට හසුකරගත් ග්‍රාම නාම සමාන පද සංයෝජන වලින් යුක්ත වන අතර ඒවායේ පහත දක්වෙන විශේෂතා දැකිය හැකිය.

- භූ විෂමතාව හා භූ රූපණය - හුල**කන්ද**, වරකාපිටි**කන්ද**, මැද**කන්ද**, පස්**ගොඩ**, මිද්**දෙණිය**, මීගස්**පිටිය**, යක්කල**මුල්ල**, කොබෙයි**තුඩුව**, බෙරලි**හෙළ**, **සීනිමෝදර**, කුඩා **වැල්ල**, බටදූව
- ජලවහනය හා ජල සම්පාදනය - සූරිය**වැව**, වතුර**විල**, අඹගස් **ආර**, , දහ**අමුණ**, , කිඹිඇල
- ස්වාභාවික වෘක්ෂලතාව - කලුවර**බැද්ද**, පුහුල්**යාය**, බට**හේන**
- සමාජ -සංස්කෘතික පදනම - **ගල්වඩුගොඩ**, **කුඹල්ගොඩ**, **කරාවේගොඩ**, **අබේසුන්දර**වත්ත
- ඓතිහාසික පදනම - **ගාල්ල**, **බද්දේගම**, **ඇත්කඳුර**, **සන්දර**වල, **අගලිය**, **අම්බලන්ගොඩ**

බොහෝ ජනාවාස නාම විවිධාර්ථ පද දෙකක් හෝ කිහිපයක් එකතු වීමෙන් බිහිවී ඇත. සුලභ ලෙස භාවිත කර ඇති භාෂා රූප භාවිතයේ පැහැදිලි අවකාශීය රටාවක් පවතී. **'වැව'** අර්ධ ශුෂ්ක කලාපයට අයත් හම්බන්තොට ප්‍රදේශයේ සුලභ වීමත්, **'වැල්ල'** වෙරළබඩ හා ගඟබඩ ප්‍රදේශයන්හි බහුලව ව්‍යවහාරයට ගැනීමත් කැපී පෙනේ. එසේම **'වෙල'** යන රූපය සහිත ග්‍රාම නාම ඉතා පැහැදිලිව වී වගාබිම් ප්‍රදේශ ආශ්‍රිත ජනාවාසවල බහුලව භාවිතා වේ (සිතියම අංක 01). තවද සිතියමට අනුව **'දූව'** යන රූපය යෙදී ඇති තැන් පිරික්සීමේ දී ගංගා, වගරුබිම් හෝ කළපු ආශ්‍රිතව ඇති දූපත් ආශ්‍රයෙන් එම ජනාවාස දැකිය හැකිය. මෙපරිදි **'කන්ද'** යන රූපය කඳු හෝ ශේෂ කඳු ලක්ෂණ ඇති ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන් හි උතුරු මායිමේ දක්නට ලැබේ. **'මුල්ල '** යන රූපය ගංගා පිටාර තැන්නක ඇති උස් ස්ථානයක් දැක්වීමට යොදාගෙන ඇත. ඉහත දක්වන ලද සාධක අතුරෙන් ජනාවාස නාමකරණයට බලපා ඇති වඩාත් පොදු සාධකය වන්නේ භූගෝලීය ලක්ෂණයි. **වැව**, **කන්ද**, **ගොඩ**, **දෙණිය**, **පිටිය**, **මුල්ල**, **තුඩුව**, **වෙල**, **ගල**, **ලන්ද**, **විල**, **ආර**, **වැල්ල**, **බැද්ද**, **යාය**, **දූව**, **අමුණ**, **හෙළ**, **ඇල්ල**, **දොළ**, **මෝදර** වැනි භාෂා රූප ඊට නිදසුන් වේ. සමාජීය සාධක වශයෙන් සැලකෙන පුද්ගල නාම, රැකියාව, කුල ක්‍රමය හෝ ඓතිහාසික සාධක පදනම් කරගත් ග්‍රාම නාමකරණය වර්තමානය වනවිට භාවිතයෙන් ඉවත් වෙමින් පවතී.



## සමාලෝචනය

ශ්‍රී ලංකාවේ ලිඛිත ඉතිසාසය තුළ ජනාවාස නාමකරණයේ මුල් අවස්ථාව වන්නේ පුද්ගල නාම මූලික ගම් බිහිවීමයි. එතැන් පටන් ජනාවාස නම්කිරීම කෙරෙහි විවිධ සාධක බලපා තිබේ. දක්ෂිණ ශ්‍රී ලංකාවේ ජනාවාස නම් තැබීමේ දී භූමියේ පිහිටීම සහ භූ භෞතික ලක්ෂණ බහුලව බලපා ඇති අතර සමාජයීය සාධකවල බලපෑම එතරම් කැපී පෙනෙන මට්ටමක නොපවතී. තවද භූගෝලීය පදනම මත පටබැඳි ඇති ස්ථාන නාමයන්හි අවකාශීය ව්‍යාප්තිය ඇසුරෙන් දක්නට ලැබෙන කැපී පෙනෙන ලක්ෂණය වන්නේ ආවේණික බව සහ විවිධත්වයයි. මෙම අධ්‍යයනයේ දෙවන අදියර ලෙස හඳුනාගත් සුවිශේෂී ග්‍රාම නාම පටබැඳීමට මුල් වී ඇති සාධකයන්හි වර්තමාන වලංගුතාව ක්ෂේත්‍රීය අධ්‍යයන ඇසුරින් පරීක්ෂා කිරීමට අපේක්ෂා කෙරේ.

**මුඛ්‍ය පද :** දක්ෂිණ ශ්‍රී ලංකාව, ජනාවාස විකාසනය, නාමකරණය, සාධක විශ්ලේෂණය

## මූලාශ්‍රය


අහුබුදු, ඒ. (1987), ලංකා ගම් නම් වහර, ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ.

එල්ලාවල, එච්. (1962), පුරාණ ලංකාවේ සමාජ ඉතිහාසය, ශ්‍රී ලංකා මුද්‍රණ දෙපාර්තමේන්තුව

ගුණසේකර, බී. (1975), ගාල්ලේ ග්‍රාම නාම සහ විත්ති, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

ධීරානන්ද කළාණවංශ හිමි, කුඩාවැල්ලේ (1967), ශ්‍රී ලංකාවේ ඓතිහාසික භූමි සිතුවම්, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

මේධානන්ද හිමි, එල්ලාවල. (2012), මාගම රාජධානිය, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ.

විනී විතාරණ, (1974), සාහිත්‍යයෙන් භූගෝලය : ලංකාව, අමර මුද්‍රණ ශිල්පියෝ, උණවටුන.

Maria, O. (2013), The relationship between toponymy and linguistics, University of Suceava

Pitkänen, R. L. (1998), The Nomenclatures of a Farmer and a Fisherman: Occupation as a Decisive Factor. – Proceedings of the XIXth International Congress of Onomastic Sciences, Vol. 2, University of Aberdeen, 277–284 pp.